# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 29 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 අගෝස්තු මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 අගෝස්තු මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 45 යි.

තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1988 අංක 29 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1988 අගෝස්තු මස 16 වන දින]**

**එල්.ඩී.—ඕ. 38/88.**

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 29 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1981 අංක 1 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) (අ) මැතිවරණ කාර්ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට එවකටත් හිමිකම් ලබා ඇති දේශපාලන පක්ෂයක් නොවන යම් දේශපාලන පක්ෂයක ලේකම්වරයා විසින්, මැතිවරණ කාර්ය සඳහා ඒ පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකන මෙන් (ආ) ඡේදයේ සහ (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, කවර හෝ වේලාවක කොමසාරිස්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඒ පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ හැකි ය. ඒ පක්ෂය එසේ පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබුවහොත්, ඒ පක්ෂය සඳහා වෙන් කරවා ගැනීමට ඒ පක්ෂය අපේක්ෂා කරන්නේ අනුමත ලකුණු අතරින් කවර ලකුණක් ද යන වග ද ඒ ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් විය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරන විට, පක්ෂයේ ව්‍යවස්ථාවේ පිටපතක් සහ පක්ෂයේ නිලධරයන්ගේ ලැයිස්තුවක් ද ඒ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් කොමසාරිස්වරයා වෙත සැපයිය යුතු ය.

(ඇ) මෙහි පහත සඳහන් කාලසීමාවන් ඇතුළත දී (අ) ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට දේශපාලන පක්ෂයක ලේකම්වරයාට හැකියාව ලැබෙන්නාක් සේ ඒ ඡේදයේ ඇතුළත් කිසිවක් කියවීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය. එම කාලසීමාවන් නම් :—

(i) පාර්ලිමේන්තුව විසුරුවා හරින ප්‍රකාශනයක දිනයෙන් හෝ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

2—ජ 104410—3,585 (88/07)

යටතේ මැතිවරණයක් පවත්වන ලෙස නියම කෙරෙන නියමයක දිනයෙන් හෝ ආරම්භව, ඒ ප්‍රකාශනයේ හෝ නියමයේ නිශ්චය කොට දැක්වෙන, ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව ; හෝ

(ii) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ දිනයෙන් ආරම්භව ඡන්ද විමසීම සඳහා ඒ නියමයෙන් නියම කර ඇති දිනයෙන් අවසන් වන කාලසීමාව ; හෝ

(iii) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ පැවැත්වෙන ඡන්ද විමසීමක් පිළිබඳව ඒ පනතේ 10 වන වගන්තිය යටතේ වූ දැන්වීමක දින යෙන් ආරම්භව, ඒ පනතේ 22 වන වගන්තිය යටතේ කරන ලද නියමයක, ඒ ඡන්ද විමසීම සඳහා නිශ්චිතව නියම කර ඇති දිනයෙන් අවසන් වන කාලසීමාව ; හෝ

(iv) 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත යටතේ පැවැත්වෙන ඡන්ද විමසීමක් පිළිබඳව ඒ පනතේ 10 වන වගන්තිය යටතේ කරනු ලැබූ දැන්වී මක දිනයෙන් ආරම්භව, ඒ පනතේ 22 වන වගන්තිය යටතේ කරනු ලැබූ දැන්වීමක, ඒ ඡන්ද විමසීම සඳහා නිශ්චිතව නියම කර ඇති දිනයෙන් අවසන් වන කාලසීමාව ; හෝ

(v) පළාත්පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පැවැත්වෙන ඡන්ද විමසීමක් පිළිබඳව ඒ ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ කරනු ලැබූ දැන්වීමක දිනයෙන් ආරම්භව, ඒ ආඥාපනතේ 38 වන වගන්තිය යටතේ කරනු ලැබූ දැන්වීමක, ඒ ඡන්ද විමසීම සඳහා නිශ්චිතව නියම කර ඇති දිනයෙන් අවසන් වන කාලසීමාව ; හෝ

(vi) 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනතේ 2 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයක දිනයෙන් ආරම්භව, ජන මතවිචාරණය පැවැත්වීම සඳහා ඒ ප්‍රකාශනයෙන් නියමිත දිනයෙන් අවසන් වන කාලසීමාව.

(ඇ) දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමකට කොමසාරිස්වරයා විසින් ඉඩ දෙනු නොලැබූ අවස්ථාවක, ඒ පළමු ඉල්ලීමට ඉඩ නොදීමේ නියමයේ දින සිට මාස හයක කාලසීමාවක් ඉකුත් වනතෙක්, ඒ දේශපාලන පක්ෂය සම්බන්ධයෙන්, ඒ ඡේදය යටතේ කිසි ඉල්ලීමක් ඉදිරිපත් නොකළ යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.